# III මහ බැංකු ගිණුම් හා ගනුදෙනු

1964 වසරේ මහ බැංකුවේ මුදල් පිළිබඳ ගිණුම් II වැනි පරිශිෂ්ටයේ 6 වැනි සංඛ්‍යා සටහනෙහි දක්වේ. 1963 වසර හා සැසඳීමේදී දක්නට ලැබුන ප්‍රධාන වෙනස්කම් පහත දැක්වේ.

| | වෙනස | |
|---|---|---|
| | රුපියල් දශ ලක්ෂ | සියයට ගණන |
| මුළු ඉල්ලුම් වගකීම් .. .. .. | + 78·4 | + 6·4 |
| සංසරණයෙහි ඇති මුදල් .. .. | + 31·3 | + 3·5 |
| ඉල්ලුම් තැන්පතු .. .. .. | + 47·1 | + 14·5 |
| (වෙළෙඳ බැංකුවල) .. .. .. | + 39·3 | + 36·2 |
| ජාත්‍යන්තර සංචිතය .. .. | + 21·7 | + 19·0 |
| දේශීය වත්කම් .. .. .. | +111·1 | + 8·8 |
| රජයේ හා රජය ඇපවූ සුරැකුම් පත් .. .. | +123·2 | + 12·0 |

\+ වැඩිවීම

රන්පවුම් ඩොලර් අනුපාතිකයේ වෙනස්වීම් වලට අනුරූපව ඇමරිකානු ඩොලරයක මහබැංකු අනුපාතිකයද (I ආ (ඇ) පරිශිෂ්ටයේ දැක්වෙන පරිදි) විටින් විට වෙනස් වෙයි.

රන් පවුම් සහ ඉන්දීය රුපියල සඳහා මහ බැංකු අනුපාතිකයන්හි වෙනසෙක් අවුරුද්ද තුළදී ඇති නොවිණි. එකී අනුපාතිකයන් පහත දැක්වේ.

| | | විදුලි පුවත් මගින් මිලට ගැනීම | විදුලි පුවත් මගින් විකිණීම |
|---|---|---|---|
| රන්පවුම් | එතැන් | සි. 1 පැ. 6 3/64 | සි. 1 පැ. 6 1/32 |
| (ලංකා රුපියලකට) | ඉදිරි | එතැන් සඳහා | එතැන් සඳහා |
| | (සමස තෙක්) | මසක වට්ටම | මසක අධිමිල |
| | | පැ. 1/128 | පැ. 1/128 |
| ඉන්දියානු රුපියල් | එතැන් | රු. 99 3/4 | රු. 99 13/16 |
| (සියයට) | ඉදිරි | එතැන් සඳහා | එතැන් සඳහා |
| | | මසක වට්ටම | මසක අධිමිල |
| | (සමස තෙක්) | රු. 1/32 | රු. 1/32 |

මහ බැංකුවේ විදේශීය විනිමය ගනුදෙනු II වැනි පරිශිෂ්ටයේ 11 වැනි සංඛ්‍යා සටහනේ දක්වා ඇත.

ඇතැම් නියමිත ගනුදෙනු නිසා උද්ගතවන රජයේ සුරැකුම්පත් හා භාවිතීය පොරොන්දු නෝට්ටු ඇපයට තබා දෙන අත්තිකාරම් සඳහා වන මහ බැංකු පොළී අනුපාතිකය වර්ෂයකට සියයට 4 ගණනේ නොවෙනස්ව පැවතිණි. එසේම, මෙරට වගාකරන කෘෂිකාර්මික නිෂ්පාදිත මිලට ගැනීම, විකිණීම හා ගබඩා කිරීම නිසා උද්ගතවන සමුපකාර සමාගම්වල භාවිතීය පොරොන්දු නෝට්ටු ඇපයට තබා දෙන අත්තිකාරම් සඳහා වන මහ බැංකු පොළී අනුපාතිකයද වර්ෂයකට සියයට 3 ගණනේ නොවෙනස්ව පැවතිණි. භාණ්ඩාගාර බිල්පත් සඳහා මහ බැංකු

වෙන්කරන වට්ටම් අනුපාතිකය පිළිගත් අඩුම ටෙන්ඩර් අනුපාතික සාමාන්‍යයෙන් සියයට ½ ට තවදුරටත් නියම කැරිණි. කර්මාන්ත, කෘෂිකර්මාන්ත, වෙළෙඳාම හෝ වෙළෙඳ ව්‍යාපාර, ඇතිකිරීම හෝ සංවර්ධනය හෝ සඳහා මහ බැංකුව විසින් ණය දෙන ආයතන වලට දෙන මුදල් නැවත ගෙවීම සඳහා වූ ණය වෙනුවෙන් පොලී අනුපාතිකය වර්ෂයකට සියයට 5 ක් යැයි නියම කැරිණි.

**ව්‍යවහාර මුදල් නිකුතුව**

1964 දී රු. 100 සහ රු. 10 වටිනාකම ඇති අළුත් මෝස්තරයේ නෝට්ටු දෙකක් නිකුත් කරන ලදී. රු. 100 නෝට්ටුව මාර්තු මාසයේදීද රු. 10 නෝට්ටුව ඔක්තෝබර් මාසයේදීද නිකුත් කැරිණි.

1963 වර්ෂයේදී නිකුත් කරන ලද රු. 5 හා රු. 2 අළුත් මෝස්තරයේ නෝට්ටුවල මෙන් රු. 100 හා රු. 10 නෝට්ටුවල ද ඉදිරිපස දකුණු අත පැත්තේ දිවංගත අගමැති ගරු එස්. ඩබ්ලිව්. ආර්. ඩී. බණ්ඩාරනායක මහතාගේ පිළිරුවද වම් අත පැත්තේ සිංහලාංජන දිය ලකුණද වෙයි. අළුත් නෝට්ටු කලින් මෝස්තරයේ එම වටිනාකම්වල නෝට්ටුවලට වඩා කුඩාය. එසේම නෝට්ටුවල කෙළින් අතට ලෝහමය නූලක් කවා ඇත.

රු. 100 නෝට්ටුවේ පිටුපස සීගිරි අප්සරාවකගේ අනුරුවක් දක්වෙන අතර උඩ සහ යට කෙළවරේ පනේලවල ඒ ඒ ප්‍රමාණයෙන් යුතු කුඩා අකුරු ඇතුළත් කොට ඇත. රු. 10 නෝට්ටුවේ පිටුපස මැද තීරු දෙකක් තුළ අනුරාධපුරයේ දොරටුපාල රූපයේ අනුරුවක් දිස්වෙයි. පැතිවල පනේල කුඩා අකුරුවලින් පිරී ඇත.

1964 මාර්තු මාසයේදී, තඹ, නිකල් වලින් සෑදූ අළුත් රුපියල් 1 කාසියක්ද නිකුත් කරන ලදී. 1963 දී නිකුත් කරන ලද අළුත් මෝස්තරයේ අතිරේක කාසිවල මෙන්ම මෙම අළුත් රුපියලේ කාසියේද ඉදිරිපස ලංකාවේ සන්නාහ සලකුණ දිස්වේ. එහි අනෙක් පැත්තේ මැද අන්නාසි මල් රටාවෙන් සැකසූ විරාගත සිංහල මෝස්තරයක්ද සිංහල සිතුවම් මෝස්තරයක් වන ලියවැලෙන් සකසා ගත් රටා අතර කාසියේ වටිනාකම සිංහල, දෙමළ හා ඉංග්‍රීසි අකුරුවලින් යොදා ඇත.

**ආදායම් හා වියදම්**

මේ වසරේ මහ බැංකුවේ ආදායම රුපියල් 3,00,64,844·05 ක් විය. වසරේ මහ බැංකු වියදම මුදල් නීති පනතේ 38 වැනි වගන්තියේ විධිවිධාන වලට අනුව සංචිත සඳහා වෙන් කැරුන රුපියල් 1,12,62,176·79 ඇතුළුව රුපියල් 2,90,64,844·05 ක් විය. ශුද්ධ ලාභය වූ රුපියල් 10,00,000 මුදල් නීති පනතේ 39 (අා) වගන්තියේ විධිවිධාන අනුව අතිරික්තයට බැර කැරිණි. එසේ කැරුනේ, 1964 දෙසැම්බර් අවසානය වන විට මහ බැංකුවේ ප්‍රාග්ධන ගිණුමේ එකතුව, මහ බැංකුවේ මුළු වත්කම්වල හා විදේශීය මුදල්වලින් ඇති මහ බැංකුවේ වත්කම්වල වෙනසින් සියයට 15 ට අඩුවූ නිසාය. දැනට ඇති අතිරික්තය රුපියල් කෝටි 5·3 කි.

**බැංකු පරිපාලනය**

1964 දී, මුදල් නීති පනතේ 29 (1) වගන්තිය යටතේ, බැංකු පරිපාලන දෙපාර්තමේන්තුව විසින් වෙළෙඳ බැංකු 8 ක් පරීක්ෂාකර බලන ලදී. 29 (2) වගන්තිය ප්‍රකාර, මුදල් මණ්ඩලයේ නියෝගයක් අනුව, වෙළෙඳ බැංකුවක් නොවන බැංකු ආයතනයක්ද පරීක්ෂා කරන ලදී.

1957 අංක 42 දරන බැංකු හර බද්ද ක්‍රියාත්මක කිරීමෙහි කාර්යයන් සහ 1961 අංක 65 දරන මුදල් නීති පනතේ, බැංකු ගිණුම් ඇරඹීම හා සම්බන්ධිත III වැනි කොටස ක්‍රියාත්මක කිරීමේ කටයුතු තවදුරටත් දෙපාර්තමේන්තුව විසින් කරනු ලැබීය.

ඉහත සඳහන් බැංකු පරීක්ෂාවලට අමතරව, කිසියම් නීතියක් හෝ රෙගුලාසියක් උල්ලංඝනය කොට ඇත්තේදැයි දැනගැනීම සඳහා අවශ්‍ය වූ විට, දෙපාර්තමේන්තුව බැංකුවල පොත්ද පිරික්සන ලදී.